# උත්ථාන සමයේ සතරවන සතිය
# අඟහරුවාදා

## පළමුවන කියැවීම

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියාපොතෙන් ගත් පාඨයෙකි ක්‍රියා 11:19–26

**"ඔව්හු ග්‍රීකයන්ට ද සුබාරංචිය ප්‍රකාශ කළහ."**

ස්තේපන් නිසා හටගත් පීඩාව කරණකොටගෙන විසුරුවනු ලැබූ අය ජුදෙව්වරුන්ට මිස අන් කිසිවෙකුට දහම ප්‍රකාශ නොකොට, පිනීසිය ද සයිප්‍රසය ද අන්තියෝකිය ද දක්වා ගමන් කළහ. එහෙත් ඔවුන් අතරෙන් සයිප්‍රසයේ ද සිරේනියේද වැසියන් වූ සමහරෙක් අන්තියෝකියට පැමිණ ග්‍රීකයන්ට කතා කරමින් ජේසුස් ස්වාමින් වහන්සේ පිළිබඳ සුබ අස්න ප්‍රකාශ කළහ. ස්වාමින් වහන්සේගේ බලය ඔවුන් මත පතළ විය. එකල විශාල සංඛ්‍යාවක් අදහා ගෙන ස්වාමින් වහන්සේ වෙතට හැරුණාහ.

ඔවුන් පිළිබඳ පුවත ජෙරුසලම් සභාවට සැළ විය. එවිට ඔව්හු බාර්ණබස් අන්තියෝකියට යැවූහ. ඔහු පැමිණ දේව වරප්‍රසාදය දැක සන්තෝෂ වී ස්වාමින් වහන්සේට පක්ෂපාතව ස්ථිරව පවතින සේ සියල්ලන්ට අනුශාසනා කළේය. බාර්ණබස් වනාහි යහපත් වූ ද ශුද්ධාත්මයාණන්ගෙන් හා ශ්‍රද්ධාවෙන් පූර්ණ වූ ද මිනිසෙකි. මෙසේ මහත් සමූහයක් ස්වාමින් වහන්සේ සරණ ගියහ.

බාර්ණබස් සාවුල් සොයමින් තාර්සසයට ගොස් ඔහු හමුවී අන්තියෝකියට කැඳවාගෙන ආවේය. ඔව්හු අවුරුද්දක් මුළුල්ලෙහිම සභාව හා එක්රැස්ව මහත් සමූහයකට ඉගැන්වූහ. "ක්‍රිස්තියානි" යන නාමය ගෝලයන්ට පළමු කොට දෙනු ලැබුවේ අන්තියෝකියේ දී ය.

දේව වාක්‍යය එසේය.

# පිළිතුරු ගීය

ගීතාවලිය 87 : 1 – 7

පිළිතුර: සකල ජාතීනි, සමිඳුන්ට ප්‍රශංසා කරන්න.

ගීය:

ශුද්ධ කන්ද මත සමිඳාණෝ සිය නගරය ගොඩනැගූ සේක. ඉශ්රායෙල්හි අන් කිසි තැනකට වඩා සමිඳාණෝ ජෙරුසලමට ප්‍රේම කරන සේක.
එම්බා දෙව් නුවර! ඔබ ගැන අසිරිමත් දෙය පවසනු ලබන්නේ ය.

'මා පිළිගත්ත ජාතීන් අතර මිසරය සහ බබිලෝනිය සඳහන් කරන්නෙමි. ජෙරුසලමේ වැසියන් සමඟ පිලිස්තිය, තීර් සහ ඉතියෝපියාව යන දේශවල ජනයා ද ගණන් කරන්නෙමි'.

'මොහු මෙතැන ජන්ම ලාභය ලැබීය' යි මිනිස්සු කියන්නෝය. සියොන් කන්ද ගැන මෙසේ කියනු ලබන්නේය. 'සියලු ජාතීහු එහි උපත ලද්දෝය. මහෝත්තමයාණෝ ඇය ශක්තිමත් කරන සේක.

ජනතාවන්ගේ ලේඛනයන් සකස් කරන විට සියලු දෙන ජෙරුසලම් වැසියන් ලෙස 'මොහු මෙතැන ජන්ම ලාභය ලැබීය' යි සමිඳාණෝ ගණන් ගන්න සේක.
අපේ සියලු ආසිරිවල උල්පත සියොන් ය' යි කියමින් ඔව්හු ගී ගයමින් නටන්නෝය.

# සාධුකාරය

ආලේලූයා! ආලේලූයා!
"මාගේ බැටළුවෝ මාගේ කටහඬ අසති.
මම ද ඔවුන් හඳුනමි.
ඔව්හු ද මා පසු පස්සේ එති" යි
සමිඳාණෝ වදාරන්නාහ.
ආලේලූයා!

# සුවිශේෂය

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය. 10: 22–30

**"මා ද පියාණන් වහන්සේ ද එකම ය."**

එකල පෙරුසලමේ කැප කිරීමේ මංගල්‍යය පවත්වනු ලැබීය. ඒ ශීත ඍතුව විය. ජේසුස් ස්වාමින් වහන්සේ දේව මාලිගයේ සලමොන්ගේ ද්වාර මණ්ඩපයේ සක්මන් කරමින් සිටි සේක. එවිට ජුදෙව්වරු පැමිණ උන්වහන්සේ වට කරගෙන, "ඔබ කොතෙක් කල් අප සැක පිට තබන සේක් ද? ඔබ ක්‍රිස්තුවරයාණෝ නම් පැහැදිලි ලෙස අපට කිව මැනැවැ" යි කීය.
ජේසුස් වහන්සේ ඔවුන්ට පිළිතුරු දෙමින් "ඔබට මම කීවෙමි. එහෙත් ඔබ විශ්වාස නොකරන්නහුය. මාගේ පියාණන් වහන්සේගේ නාමයෙන් මා කරන ක්‍රියාවෝම මා ගැන සාක්ෂි දෙති. එහෙත් මාගේ බැටළුවන් නොවන බැවින් මා විශ්වාස නොකරන්නහුය. මාගේ බැටළුවෝ මාගේ කටහඬ අසති. මම ද ඔවුන් අඳුනමි. ඔව්හු ද මා පසු පස්සේ එති. මම ඔවුන්ට සදාතන ජීවනය දෙමි. ඔව්හු කිසි කලෙකත් විනාශ නොවෙති. කිසිවෙක් ඔවුන් මා අතින් පැහැර නොගනිති. ඔවුන් මා හට දෙවා වදාළ මාගේ පියාණන් වහන්සේ සියල්ලන්ට වඩා ශ්‍රේෂ්ඨය. පියාණන් වහන්සේගේ අතින් ඔවුන් පැහැර ගන්නට කිසිවෙකුට නොහැකිය. මාත් මාගේ පියාණන් වහන්සේත් එකම ය" යි වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේය